# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023
2025 අගෝස්තු /සැප්තැම්බර්

## මානවශාස්ත්‍ර පීඨය

## සිංහල (නව නිර්දේශය)

**පුරාතන සිංහල සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය- SINH 18224**

පළමුවන කොටසත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. අ) පහත සඳහන් උද්ධෘතයේ අර්ථය ලිහිල් බසින් ලියා, අවස්ථා සම්බන්ධය ලියන්න.

ඒ කුමාරයන් පලා යන්නා තමන්ගේ ඇඟ නබප්‍රහාර කොට තෙල් ගල්වා කිලුටු කඩක් ඇඳ ගෙන වැද හෙව, ''රජ්ජුරුවන් වහන්සේ මා විචාළ සේක් වී නම් ලෙඩ ව වැද හෝනා සේකැ''යි කියවයි අන්තඃපුර වාසීන්ට උගන්වා වැද හොත්තාහ. රජ්ජුරුවෝත් නුවරට වැද නුවර ප්‍රදක්ෂිණා කොට රජ ගෙට වැද ''බිසවුන් කොයි දැ''යි විචාළහ. අන්තඃපුරයේ ඇත්තෝ කියන්නාහු ''ලෙඩ ව වැද හෝනා සේකැ''යි කීහ. රජ්ජුරුවොත් බිසවුන් ඉන්නා ගෙට ගොස් යාන පිට ඉඳ, ''තොපට අඵාසු කිම් දැ''යි විචාළහ. බිසවු බැණ නොනැඟී වැද හෙව කියන්නාහු ''සස්වාමික කෙනෙක් වූ නම් මෙසේ ඉදිමෝ ද, අපටත් ස්වාමි කෙනෙක් ඇද්ද? නුඹ වහන්සේ ඇති නියාව දන්නේ දුටු විට ය''යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු ''ඇයි තොපට ගහට කළෝ කවුරු දෑ''යි කීහ. ''අනික් කවුරු ද? නුඹ වහන්සේ මේ නුවර ඨකවලට රඳවා ගියෝ කවුරු දෑ''යි විචාළාහ.

(ලකුණු 12 යි. 8+4)

ආ) පහත සඳහන් පද්‍යයන්හි අර්ථය ලිහිල් බසින් ලියා, කවියා සතු වර්ණනා චාතුර්යය කෙටියෙන් පහදන්න.

ග නේ මිණි බැබළි කිරණෙ'ව් සත පාය
ර නේ යටග සැවුලිඳු දද ගල පාය
අ නේ ලකර කළ පුර අප නර පාය
පෙ නේ දකුණ මහසෙන් දෙව් රද පාය

ව ල දින අදහසින් මෙන් සුරගඟ අඟ න
න ල බල සසල දළ රළ පෙළ නුඹ නැඟෙ න
වෙ ල ළස ගැවසි මුතු සක් පබළු බබළ න
බ ල මහ මුහුද එම සඳ උතුරෙන් පෙනෙ න

ස න් න න් සිහින් ගෙඳි සෙවණැලි වැලි තෙලෙ න
තැ න් තැ න් වලම සැතපී සියුමැලි බැවි න
ර න් ව න් කරල් ගෙන එන ගිරවුන් අති න
ය න් ම න් තොසින් මග තොරතුරු නියම දෑ න

තිල තුරඟුට නැඟෙමින් රිවිදෙව් සිරි න
දුල කර සේසත් මිණි බරණ කිරණි න
බල පිරිසෙන් සහ යාපා පටුන් ගෙ න
බල සේනානායක සපු කුමරු එ න

(ලකුණු 12 යි. 8+4)

## II කොටස

02. මනුෂ්‍ය සන්තානගත ගූඪ චෛතසික නිරූපණයෙහි ලා ජාතකකථාකරු දැක්වූ සාමර්ථ්‍යය කෙබඳු දැයි නිදසුන් දෙමින් පිරික්සන්න.

03. 'තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවිත්වයට සැළලිහිණි සන්දේශය මනා නිදසුනකි.' උදාහරණ දෙමින් විමසන්න.

04. 'කුරුණෑගල යුගයේ සාහිත්‍යයෙන් පිළිබිඹු වන විශේෂ ප්‍රවණතාව වන්නේ ගද්‍ය රචනා කෙරෙහි ප්‍රමුඛත්වය ලබාදීමයි.' මෙම ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

05. 'ගම්පොළ යුගය වනාහි ගද්‍යයේත් පද්‍යයේත් සමගාමී විකාසනයක් පිළිබිඹු කෙරෙන යුගයකි.' නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

කෝට්ටේ යුගයේ පද්‍ය සාහිත්‍ය නිර්මාණ, ආකෘතියෙන් මෙන්ම අන්තර්ගතයෙන් ද විවිධතාවක් හා විචිත්‍රතාවක් ප්‍රකට කරන ආකාරය සනිදර්ශන ව විග්‍රහ කරන්න.

## III කොටස

06. ශබ්දෝත්පාදන ක්‍රියාවලිය පැහැදිලි කරමින්, භාෂණ සිංහලයේ ශබ්ද පද්ධතිය විභාග කර දක්වන්න.

07. සිංහල භාෂා භාවිතය කෙරෙහි සාවධාන වෙමින්, භාෂාද්විරූපතා අවස්ථාවක දී දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

08. ප්‍රාස්තාවික භාෂා ස්වරූප (Registers) හා පරිමිත භාෂා (Restricted Language) යන ව්‍යවහාර හඳුන්වා දී, ඒවායේ අනන්‍යතා ලක්ෂණ පරීක්ෂා කරන්න.

09. 'කිසියම් සංස්කෘතියක් හඳුනාගැනීමට ඇති හොඳම මූලාශ්‍රය වන්නේ ඊට අදාළ වූ භාෂාවයි.' නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

භාෂාව හා සමාජය අතර ඇති සබඳතාව පිළිබඳ ප්‍රාමාණික විස්තරයක් කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට ප්‍රමාණවත් සටහන් ලියන්න.

i. භාෂණ සිංහලයේ අස්පර්ශ ශබ්ද
ii. ලංකාවේ ප්‍රාදේශීය උපභාෂා
iii. උපභාෂා බිහිවීමෙහිලා ජනසංක්‍රමණවල බලපෑම
iv. සිංහල භාෂාවේ කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය ප්‍රභේද

(02-10 පිළිතුරුවලට ලකුණු 19 බැගිනි)

******************************